# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1975/48 - 2016 ජූලි මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2016.07.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (x).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, ලියාපදිංචි අංක පී. බී. 4833 සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින් එකී පනත යටතේ සාදනු ලැබූ 2016 ජනවාරි මස 19 වැනි දින අංක 1950/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''මෘදුකාංග ඉංජිනේරුකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව'' යන සටහනට සහ එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය එකතු කිරීම මගින් එම නියමයේ II වන උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**උපලේඛනය**

| "*I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *උපාධිය* | *උපාධි සඳහා කෙටි යෙදුම* |
| ව්‍යාපාර පරිපාලනපති | එම් බී ඒ |
| ව්‍යාපාර අධ්‍යයනපති | එම් බී එස් |
| විද්‍යාවේදී ගෞරව මෘදුකාංග ඉංජිනේරු | බී එස් සී ගෞරව (සොෆ්ට්වෙයා ඉංජිනියරින්) |
| ගිණුම්කරණය සහ මුදල් කළමනාකරණ ගෞරව | බී එම් ගෞරව (ඒ සී සී සහ එෆ් අයි එන්)" |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 ජූලි මස 13 වැනි දින.
කොළඹ දී ය.

07 - 1129


1A - PG 3010 — 507 (2016/07)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*